*සැ. යු.*– 2007.01.26 දින පළවූ අංක 1478 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,483 - 2007 පෙබරවාරි 02 වැනි සිකුරාදා - 2007.02.02**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 74 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... .. | — |
| මිළ පාලන දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 78 |
| නැවියන්ට දැන්වීම් .. ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 පෙබරවාරි මස 09 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 ජනවාරි මස 26 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2007 අංක 34

DVF/RECT/580(iv)AY.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව-ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද මරණින් පසු නිල උසස් කිරීමක්

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ මරණයෙන් පසු නිල උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර තිබේ.

(අ) මේජර් ජෙනරාල් පාරමි සුදම්මික බණ්ඩාර කුලතුංග, ආර්එස්පී යූඑස්පී යූඑස්ඒඩබ්සී

(1) 2006 ජූනි මස 26 දින සිට මරණයෙන් පසු ලුතිනන් ජෙනරාල් නිළයට උසස් කිරීම

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,<br>
ලේකම්,<br>
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,<br>
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006ක් වූ ජූලි මස 06 වැනි දින,<br>
කොළඹ දී ය.

02-138/2

---

2007 අංක 35

DRF/RECT/770(18).

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව-ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිළ උසස් කිරීම, තනතුරු අත්හැරීම් හා පත් කිරීම්

#### නිළ උසස් කිරීම්

1. 2006 ජනවාරි මස 31 වැනි දින සිට තාවකාලික මේජර් ජෙනරාල් වශයෙන්

(අ) බ්‍රිගේඩියර් ජේ. ජේ. පී. එස්. ටී. ලියනගේ, ආර්එස්පී යූඑස්පී අයිජී එල්ඩීඑම්සී

2. 2006 මැයි මස 04 වැනි දින සිට තාවකාලික මේජර් ජෙනරාල් වශයෙන්

(අ) බ්‍රිගේඩියර් එල් බී අලුවිහාරේ යූඑස්පී පීඑස්සී ඒඒටීඕ

3. 2006 අගෝස්තු මස 03 වැනි දින සිට තාවකාලික මේජර් ජෙනරාල්වරුන් වශයෙන්

(අ) බ්‍රිගේඩියර් එස්ජී සූරියආරච්චි යූඑස්පී<br>
(ආ) බ්‍රිගේඩියර් ඩබ්ආර් වසන්ත කුමාර<br>
(ඇ) බ්‍රිගේඩියර් ආර්කේපී රණවීර යූඑස්පී<br>
(ඈ) බ්‍රිගේඩියර් එල්එම් සමරවීර ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී

#### තනතුරු අත්හැරීම් හා පත් කිරීම්

4. 2006 ජනවාරි මස 31 වැනි දින සිට

(අ) බ්‍රිගේඩියර් ජේජේපීඑස්ටී ලියනගේ ආර්එස්පී යූඑස්පී අයිජී එල්ඩීඑම්සී යුද්ධ හමුදා මූලස්ථානයේ බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ තනතුරු අත්හැරීම හා 23 වන සේනාංක මූලස්ථානයේ සේනාංකාධිපති වශයෙන් පත් කිරීම.

5. 2006 මැයි මස 04 වැනි දින සිට

(අ) බ්‍රිගේඩියර් එල්බී අලුවිහාරේ යූඑස්පී පීඑස්සී ඒඒටීඕ - හට කාර්ය සම්පාදක අණසක මූලස්ථානයේ කාර්ය නියුක්ත ආඥාපති තනතුර අත්හැරීම හා හට කාර්ය සම්පාදක අණසක මූලස්ථානයේ ආඥාපති වශයෙන් පත් කිරීම

6. 2006 අගෝස්තු මස 03 වැනි දින සිට

(අ) බ්‍රිගේඩියර් එස්ජී සූරියආරච්චි යූඑස්පී - ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයේ ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ තනතුර අත්හැරීම හා ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) ආඥාපති වශයෙන් පත්කිරීම

(ආ) බ්‍රිගේඩියර් ඩබ්ආර් වසන්ත කුමාර - ඉදිරි නඩත්තු පෙදෙස (උතුරු) කාර්ය නියුක්ත ආඥාපති තනතුර අත්හැරීම හා ඉදිරි නඩත්තු පෙදෙස (උතුරු) ආඥාපති වශයෙන් පත් කිරීම

(ඇ) බ්‍රිගේඩියර් ආර්කේපී රණවීර යූඑස්පී - ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයේ මූල්‍ය කළමණාකරණ ශාඛාවේ කාර්ය නියුක්ත අධ්‍යක්ෂ ජෙනරාල් තනතුර අත්හැරීම හා ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයේ මූල්‍ය කළමණාකරණ ශාඛාවේ අධ්‍යක්ෂ ජෙනරාල් වශයෙන් පත් කිරීම.

(ඈ) බ්‍රිගේඩියර් එල්එම් සමරවීර ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී - ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) කාර්ය නියුත්ත ආඥාපති තනතුර අත්හැරීම හා යුධ හමුදා මූලස්ථානයේ ප්‍රධාන ඉංජිනේරු වශයෙන් පත්කිරීම.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,<br>
ලේකම්,<br>
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,<br>
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006ක් වූ අගෝස්තු මස 17 වැනි දින,<br>
කොළඹ දී ය.

02-136

2007 අංක 36

DRF/RECT/580(iv)AY.

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාව-ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් හා මරණින් පසු උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරිගේ නිලය ස්ථිර කිරීම/මරණයෙන් පසු උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර තිබේ.

(අ) කපිතන් (තාවකාලික මේජර්) පිටවල ලියන ලලිත් ද සොයිසා විජයරත්න, ආර්එස්පී කරෙ

(1) 2006 අගෝස්තු මස 14 වැනි දින සිට මේජර් නිළය ස්ථිර කිරීම
(2) 2006 අගෝස්තු මස 14 වැනි දින සිට මරණයෙන් පසු ලුතිනන් කර්නල් නිළයට උසස් කිරීම

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006ක් වූ සැප්තැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

02-138/1

---

2007 අංක 37

DRF/21/RECT/2380

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක්, විශ්‍රාම ගැනීමක් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

#### නිල ස්ථිර කිරීම

පහත නම සඳහන් නිලධාරි 2006 සැප්තැම්බර් මස 02 වනදින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපතිඋතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/61618 කපිතන් (තාවකාලික මේජර්) පිටුවල විතානගේ නන්දසිරි යූඑස්පී, ශ්‍රීලයුපොදුසේබ

#### විශ්‍රාම ගැනිම

පහත නම සඳහන් නිලධාරියා 2006 සැප්තැම්බර් මස 03 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/61618 මේජර් පිටුවල විතානගේ නන්දසිරි යූඑස්පී, ශ්‍රීලයුපොදුසේබ

#### ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු ) උපසේවයට මාරුකිරීම

පහත නම සඳහන් නිලධාරියා 2006 සැප්තැම්බර් මස 03 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය ( පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/61618 මේජර් පිටුවල විතානගේ නන්දසිරි යූඑස්පී, ශ්‍රී ලයුපොදුසේබවී

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ඔක්තෝම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

02-27

---

2007 අංක 38

DRF/21/RECT/2379.

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිළ ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

#### නිළ ස්ථිර කිරීමක්

පහත නම සඳහන් නිලධාරි 2006 සැප්තැම්බර් මස 17 වන දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/60925 කපිතන් (තාවකාලික මේජර්) විජේපාල අබේසිංහ මුදියන්සේලාගේ නයනානන්ද විජේබණ්ඩාර විපාරෙ

#### විශ්‍රාම ගැනිම

පහත නම සඳහන් නිලධාරියා 2006 සැප්තැම්බර් මස 18 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/60925 මේජර් විජේපාල අබේසිංහ මුදියන්සේලාගේ නයනානන්ද විජේබණ්ඩාර විපාරෙ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ඔක්තෝම්බර් 29 වැනි දින,
කොළඹදීය.

02-62

2007 අංක 39

DRF/RECT/580 (v) AY.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීමක් හා මරණින් පසු උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරිගේ නිලය උසස් කිරීම/මරණයෙන් පසු උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර තිබේ :

(අ) කපිතන් (තාවකාලික මේජර්) විජේතුංග ආරච්චිගේ සමින්ද්‍ර ප්‍රජාලි විජේතුංග ආර්එස්පී,ගැහේබ

(1) 2006 ඔක්තෝබර් මස 06 දින සිට මේජර් නිලය ස්ථිර කිරීම,
(2) 2006 ඔක්තෝබර් මස 06 දින සිට මරණයෙන් පසු ලුතිනන් කර්නල් නිලයට උසස් කිරීම.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 නොවැම්බර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

02-29

---

DRF/21/RECT/2378.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අපකීර්ති සහගත ලෙස යුද හමුදා සේවයෙන් පහ කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරියා 2006 ජුනි මස 30 වන දින සිට අපකීර්ති සහගත ලෙස යුද හමුදා සේවයෙන් පහ කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/61520 කපිතන් මේනක රසික ප්‍රසාද් හඳුගල ආර්ඩබ්පී ආර්එස්පී, ශ්‍රීලකාහ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 සැප්තැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

02-28

---

2007 අංක 40

DRF/RECT/580(iv)AY.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව-ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද මරණින් පසු නිල උසස් කිරීමක්

01. පහත නම සඳහන් නිලධාරිගේ මරණයෙන් පසු නිල උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර තිබේ :

(අ) නි/64785 කපිතන් රංපටින් ගෙදර ජයන්ත කුමාරරත්න විපාරෙ - 2006 අගෝස්තු මස 12 වැනි දින සිට මරණයෙන් පසු මේජර් නිලයට උසස් කිරීම.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006ක් වූ සැප්තැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

02-138/3

---

2007 අංක 41

DRF/RECT/580(vi)AY.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව-ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද මරණින් පසු නිල උසස් කිරීමක්

01. පහත නම සඳහන් නිලධාරිගේ මරණයෙන් පසු නිල උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර තිබේ :

(අ) නි/65269 කපිතන් බස්නායක මුදියන්සේලාගේ තුෂාර කුමාර වරාපිටිය, ශ්‍රීලංසිරෙ - 2006 අගෝස්තු මස 23 වැනි දින සිට මරණයෙන් පසු මේජර් නිලයට උසස් කිරීම.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006ක් වූ සැප්තැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

02-63

2007 අංක 42

DRF/RECT/580(iv)AY.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව-ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද මරණින් පසු නිල උසස් කිරීම

01. පහත නම් සඳහන් නිලධාරීන්ගේ මරණයෙන් පසු නිල උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර තිබේ :

(අ) නි/63052 කපිතාන් හිටිහාමි මුදියන්සෙලාගේ සාලිය දීප්ති විජේනායක, ගැහේබ - 2006 ඔක්තෝබර් මස 11 වැනි දින සිට මරණයෙන් පසු මේජර් නිලයට උසස් කිරීම,

(ආ) නි/64478 කපිතාන් සම්පත් තුෂාර තන්තිරිගේ, ශ්‍රීලසසබ - 2006 ඔක්තෝබර් මස 11 වැනි දින සිට මරණයෙන් පසු මේජර් නිලයට උසස් කිරීම,

(ඇ) නි/64675 කපිතාන් සමන් ප්‍රියන්ත පාඩිප්පෙරුම, ශ්‍රීලංඉ - 2006 ඔක්තෝබර් මස 11 වැනි දින සිට මරණයෙන් පසු මේජර් නිලයට උසස් කිරීම

(ඈ) නි/65310 කපිතාන් ලියනෝරාගේ පද්මාල් බන්දු ගුනවර්ධන විපාරෙ - 2006 ඔක්තෝබර් මස 11 දින සිට මරණයෙන් පසු මේජර් නිලයට උසස් කිරීම,

(ඉ) නි/65327 කපිතාන් හේවා විරිදුගේ චන්ත අනුරංග විපාරෙ - 2006 ඔක්තෝබර් මස 11 වැනි දින සිට මරණයෙන් පසු මේජර් නිලයට උසස් කිරීම.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006ක් වූ නොවැම්බර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

02-138/4

---

2007 අංක 43

DRF/21/RECT/2324.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරියා 2006 අප්‍රේල් මස 01 වන දින සිට අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/61081 ලුතිනන් අතුල දේශප්‍රිය තිරිමාවිතාන ශ්‍රීලංසංබ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ඔක්තෝබර් මස 09 වැනි දින,
කොළඹ දී ය.

02-26

---

2007 අංක 44

DVF/RECT/9AX(1).

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව-ස්වෙච්ඡා බලසේනාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැන්වීමක්

### නිල ස්ථිර කිරීම

පහත නම සඳහන් නිලධාරි 2006 ජුනි මස 25 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/2306 කපිතාන් (තාවකාලික මේජර්) බස්නායක මුදියන්සේලාගේ ප්‍රේමලාල් සුරේන්ද්‍රනාත් බණ්ඩාර බස්නායක, ශ්‍රීලයුපොදුසේබ.

### විශ්‍රාම ගැන්වීම

පහත නම සඳහන් නිලධාරි 2006 ජුනි මස 26 වැනි දින සිට ශ්‍රී ලංකා යුද හමුදා ස්වෙච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/2306 (මේජර්) බස්නායක මුදියන්සේලාගේ ප්‍රේමලාල් සුරේන්ද්‍රනාත් බණ්ඩාර බස්නායක, ශ්‍රීලයුපොදුසේබ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006ක් වූ ජුලි මස 06 වැනි දින,
කොළඹ දී ය.

02-134/2

DVF/RECT/9AY(1).

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වෙච්ඡා බලසේනාව

### අතිගරු ජනාධිපතිතුමිය විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉවත් කිරීමක්

පහත නම සඳහන් නිලධාරී 2005 සැප්තැම්බර් මස 30 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා යුද හමුදා ස්වෙච්ඡා බලසේනාවේ අධිකාරියෙන් ඉවත් කිරීම අතිගරු ජනාධිපතිතුමිය විසින් අනුමත කර ඇත.

නි/3390 කපිතන් පැස්කුවල් හැන්දි සමන් සුසන්ත ද සිල්වා, ශ්‍රීලයුසේබ

අතිගරු ජනාධිපතිතුමියගේ අණ පරිදි,

මේජර් ජනරාල් අශෝක කේ ජයවර්ධන,
ආර්ඩබ්පී, ආර්එස්පී, විඑස්වී, යූඑස්පී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක .අමාත්‍යාංශය.

2005ක් වූ සැප්තැම්බර් මස 08 වැනි දින,
කොළඹ දී ය.

02-134/1

2007 අංක 45

DVF/RECT/262AY(1).

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වෙච්ඡා බලසේනාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් නිලධාරී 2006 මැයි මස 20 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වෙච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරනු ලැබ ඇත.

නි/60001 ලුතිනන් (උපකරණ පාලක) (පොදු රාජකාරී) කුරුප්පු ආරච්චිගේ දොන් ප්‍රේමරත්න, ශ්‍රීලංසිරෙ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006ක් වූ අගෝස්තු මස 22 වැනි දින,
කොළඹ දී ය.

02-137

---

DVF/RECT/260.

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වෙච්ඡා බලසේනාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉවත් කිරීමක්

පහත නම සඳහන් නිලධාරී 2006 ජනවාරි මස 15 වැනි දින සිට අධිකාරියෙන් ඉවත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/5832 2/ලුතිනන් මොරවක්කෝරළගේ ඉඳුනිල් ජානක ෆොන්සේකා, ගරෙ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006ක් වූ අගෝස්තු මස 22 වැනි දින,
කොළඹ දී ය.

02-135

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මතය

ණය ගිණුම් අංක : 214061 සහ 214062.

2006ක් වූ අගෝස්තු මස 10 වැනි දින පැවැත්වූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී :

"මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එල්. පී. පෙරේරා විසින් සහතික කරන ලද 1991 අගෝස්තු මස 16 වැනි දින අංක 14496 සහ මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩී. ඉලංගසිංහ විසින් සහතික කරන ලද 1999 අගෝස්තු මස 20 වැනි දින අංක 2090 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් නමින් වූ බැඳුම්කර යටතේ අශ්‍රා මෝටර් ට්‍රේඩර්ස් නමින් ව්‍යාපාරයක් පවත්වාගෙන යන තම්බි ලෙබ්බේ මොහොමඩ් අන්සාර් ණයකරු වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද, (මෙහි 1 වන උපලේඛනයේ විස්තර කර ඇති දේපල)

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එල්. පී. පෙරේරා විසින් සහතික කරන ලද 1991 අගෝස්තු මස 16 වැනි දින අංක 14495 සහ 1992 මැයි

මස 11 වැනි දින අංක 14679 සහ මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩී. ඉලංගසිංහ විසින් සහතික කරන ලද 1995 නොවැම්බර් මස 20 වැනි දින අංක 1466 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් නමින් වූ බැඳුම්කර යටතේ අශ්රා මෝටර් ට්‍රේඩර්ස් නමින් ව්‍යාපාරයක් පවත්වාගෙන යන තම්බි ලෙබ්බෙ මොහොමඩ් අන්සාර් ණයකරු වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද (මෙහි 2 වන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ).

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එල්. පී. පෙරේරා විසින් සහතික කරන ලද 1994 මාර්තු මස 17 වැනි දින අංක 15188, මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩී. ඉලංගසිංහ විසින් සහතික කරන ලද 1995 නොවැම්බර් මස 20 වැනි දින 1465 සහ මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එල්. පී. පෙරේරා විසින් සහතික කරන ලද 1998 පෙබරවාරි මස 16 වැනි දින අංක 16035 හා මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩී. ඉලංගසිංහ විසින් සහතික කරන ලද 1999 අගෝස්තු මස 20 වැනි දින 2091 දරන බැඳුම්කර යටතේ අශ්රා මෝටර් ට්‍රේඩර්ස් නමින් ව්‍යාපාරයක් පවත්වාගෙන යන තම්බි ලෙබ්බෙ මොහොමඩ් අන්සාර් ණයකරු වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද (මෙහි 3 වන උපලේඛනයේ විස්තර කර ඇති දේපල).

එකී බැඳුම්කරයන් යටතේ රුපියල් විසි එක්කෝටි හාර ලක්ෂ හාරදාස් අටසිය දොළහයි ශත හතක (රු. 21,404,812.07) මුදලක් 2006 ජූලි මස 04 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී විසි එක්කෝටි හාරලක්ෂ හාරදාස් අටසිය දොළහයි ශත හතක (රු. 21,404,812.07) මුදලක් ද හා 2006 ජූලි මස 05 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 18,390,800 මුදලක් සඳහා වර්ෂිකව 20% බැගින් වූ පොළිය ද, ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවා ද, මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එය ද අඩුකර අයකර ගැනීම සඳහා එකී අංක 14496, 2090, 14495, 14679, 1466, 15188, 1465, 16035 සහ 2091 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත උකස් කර ඇති මෙහි පහත 1 වන 2 වන සහ 3 වන උපලේඛනයන්හි වැඩිදුරටත් විස්තර කර ඇති දේපළ හා පරිශ්‍රය මහනුවර, වටපුළුව, බෝමළුව පාරේ, අංක 83/5හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කර ගනී.".

### 1 වන උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා සීමාවන් තුළ යටිනුවර ගඟවට කෝරළේ, කටුකැලේ පිහිටි මහනුවර බලයලත් මානක ටී. බී. සෝමදාස විසින් 1977 අගෝස්තු මස 04 වැනි දින මැන සාදන ලද අංක 1018 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන්කළ කටුකැලේ ආදර්ශ නිවාස වරිපනම් අංක 113/16 දරන නිවස හා පරිශ්‍රයට මායිම් එනම්, උතුරට : රක්ෂිතයෙන් ද, නැගෙනහිරට : වරිපනම් අංක 113/17 දරන පරිශ්‍රයෙන් ද, දකුණට : රක්ෂිතයෙන් ද සහ බස්නාහිරට : රක්ෂිතයෙන් ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් හතරයි දශම හතයි පහක් (අ. 0, රූ. 0, පර්. 4.75) විශාල ඉඩම හා අනෙකුත් සියලු දේ.

මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 171/84 වෙළුම/පත්ඉරුව යටතේ ලියාපදිංචි කර ඇත.

### 2 වන උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා සීමාවන් තුළ යටිනුවර ගඟවට කෝරළේ, දැන් ශ්‍රීමාවෝ බණ්ඩාරනායක මාවත මින් පෙර පේරාදෙණිය පාරෙහි පිහිටි වරිපනම් අංක 76 සහ 78ඒ සිට එච් දක්වා හා අංක 74 පරිශ්‍රයේ ඉතිරි කොටස දැන් වරිපනම් අංක 115/2 දරන පරිශ්‍රයට මහනුවර බලයලත් මානක ආර්. සී. ඕ. ද ලා මොට් විසින් මැන සාදන ලද 1973 ඔක්තෝබර් මස 5 වැනි දින අංක 4637 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කළ ලොට් 5ඒ දරන කොටසට මායිම් එනම්, දකුණු-නැගෙනහිරට : පුද්ගලික පාරෙන් ද, දකුණු-බටහිරට : එම්. එස්. ඒ. බාවාට අයත් පේරාදෙණිය පාර, වරිපනම් අංක 119/1න් ද, උතුරු-බස්නාහිරට : පායිවා යන අයට අයත් වරිපනම් අංක 115 හා 117න් ද හා උතුරු-නැගෙනහිරට : ඉහත කී පිඹුරේ ලොට් 5බී දරන කොටසින් ද සහ එහි පිහිටි සියලු දේ සමඟ ඉහත කී පිඹුරේ සඳහන් මාර්ගය මතින් හා ඔස්සේ පාවිච්චි කිරීමේ අයිතිය ද සමඟ වේ.

මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 157/113 වෙළුම/පත් ඉරුව යටතේ ලියාපදිංචි කර ඇත.

### 3 වන උපලේඛනය

1. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, දැන් මහනුවර මහ නගර සභා සීමාවන් තුළ යටිනුවර ගඟවට කෝරළේ, අස්ගිරිය පාරේ පිහිටි මහනුවර බලයලත් මානක ආර්. සී. ඕ. ද ලා මොට් විසින් මැන සාදන ලද 1974 ජනවාරි මස 25 වැනි දින අංක 4696 දරන පිඹුර ප්‍රකාර (කහපාටින් ලකුණු කර ඇති රක්ෂිතය අත හැර) බෙදා වෙන් කරන ලද ලොට් 1ට මායිම් එනම් උතුරට : ලොට් 2න් ද, නැගෙනහිරට : රක්ෂිතයෙන් (කහපාටින් ලකුණු කළ කොටස) සහ දුම්රිය දෙපාර්තමේන්තුවේ රක්ෂිතයෙන් ද, දකුණට : අස්ගිරිය පාරෙන් ද සහ බස්නාහිරට : වරිපනම් අංක 6 දරන පරිශ්‍රයෙන් ද යන මෙකී මායිම් තුළ පිහිටි අස්ගිරිය පාර වරිපනම් අංක 2 සහ 4 දරන නිවාස ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් විසිතුනයි දශම දෙකක් (අ. 0, රූ. 0, පර්. 23.2) විශාල ඉඩම (දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් රක්ෂිතය අත හැර).

මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 231/236 වෙළුම/පත්ඉරුව යටතේ ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී පිඹුරු අංක 4696 ප්‍රකාර ලොට් 2බී දරන ඉහත කී අස්ගිරිය පාරේ පිහිටි ඉඩමට මායිම් එනම්, උතුරට : කමල්ඩීන් යන අයට අයත් පිඹුරු අංක 1228හි සඳහන් ලොට් 3 දරන ඉතිරි කොටස වෙන්වන ඉනි වැටෙන් ද, නැගෙනහිරට : රක්ෂිතයෙන් ද, දකුණට : ලොට් 1න් ද හා බස්නාහිරට : ලොට් 2ඒ ගෙන් ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් හයයි දශම තුනක් (අ. 0, රූ. 0, පර්. 6.3) විශාල ඉඩම හා එහි තුළ පිහිටි සියලු දේ.

මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 226/231 වෙළුම/පත්ඉරුව යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල (මිය),
සමාගම් ලේකම්.

02-132/2

---

### ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සමමත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය, ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව, 1990 අංක 4 දරන

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ටී. එස්.අයි. වැත්තැව විසින් ලියා සහතික කරන ලද අංක 3330 හා 2006 පෙබරවාරි 10 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම "මදුරන්කුලිය සෝ මිල්" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ තනි අයිතිකරු ලෙස ව්‍යාපාරය කරගෙන යන මදුරන්කුලියේ, මහහෙට්ටි ආරච්චිගේ තුසිත ප්‍රියංකර යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද 2006 සැප්තැම්බර් 30 වැනි දිනට එකී අංක 3330 දරන උකස් බැඳුම්කරය මත එකී මහහෙට්ටි ආරච්චිගේ තුසිත ප්‍රියංකර ගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් අටලක්ෂ හැත්තෑහතර දහස් එකසිය හැට හතරකුත් ශත හතලිහක (රු. 874,164.40) ක මුදලක් සහ 2006 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් අටලක්ෂයක් (රු. 8,00,000) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රියෙල්, ජූලි සහ ඔක්තෝබර් යන මාස වල වැඩ කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනමක් මත පළකරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට හතක්(7%) ඉහළ අනුපාතිකයක් වන, ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන අනුපාතිකය මත පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් අටලක්ෂ හැත්තෑහතර දහස් එකසිය හැට හතරකුත් ශත හතළිහක (රු. 874,164.40) ක මුදල සහ 2006 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් අට ලක්ෂයක් (රු. 8,00,000) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි, සහ ඔක්තෝබර් යන මාසවල වැඩ කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සති පතා පදනමක් මත පළ කරනු ලබන බර තැබූ මධ්‍යක ණය පොලී අනුපාතයට (ඒ. ඩබ්ලිව්.පී. ආර්) වර්ෂයකට සියයට හතක්(7%) ඉහළ අනුපාතිකයක් වන, ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය අනුව හා එකී අංක 3330 දරන උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව, ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 3330 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කර ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි ද කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 4 දරන බැකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ, ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### අංක **3330** දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, දකුණු පුත්තලම් පත්තුවේ, මදුරන්කුලිය ග්‍රාමයේ පිහිටි "සැන්ඩ්වේනයි" *නොහොත්* "මදුරන්කුලිකාඩු එස්ටේට්" නැමැති ඉඩම වන උතුරට : අඩි පාරක් සඳහා වෙන් වූ බිම ද, නැගෙනහිරට : ඒ. ඩබ්ලිව්. එම්. නසීම් ට අයිති ඉඩම ද, දකුණට : අඩි පාරක් සඳහා වෙන් වූ බිම ද බස්නාහිරට : ඇලෝසියස්ට අයිති ඉඩම ද යන මායිම් ඇතුළත රූඩ් දෙකක් (අ. 0, රූ. 2, පර්. 0) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි සහ එම ඉඩමට අනුබද්ධ සියලු දේ.

පසුව කරන ලද මැනීමකට අනුව මෙම ඉඩම පහත දැක්වෙන පරිදි විස්තර කර ඇත.

ඉහත කී මදුරන්කුලිය ග්‍රාමයේ පිහිටි "සැන්ඩ්වේනයි" *නොහොත්* "මදුරන්කුලිකාඩු එස්ටේට්" නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු වී. බාලසුබ්‍රමනියම් විසින් මැන සාදනන ලද අංක 264 හා 2005.06.03 දින දරන පිඹුරේ ලොට් අංක 01 ලෙස ලකුණු කළ බිම් කට්ටිය වන උතුරට : අඩි පාරද, නැගෙනහිරට : කලින් ඩබ්ලිව්. ඒ. එම්. නසීම්ට සහ තවත් අයට අයිතිව තිබුණු ඉඩම දැනට සරණාගත කඳවුර ද, දකුණට : අඩි පාර සහ බස්නාහිරට: එස්. මේරි මේගන්ට අයිති ඉඩම ද යන මායිම් ඇතුළත රූඩ් දෙකක් (අ. 0, රූ. 2, පර්. 0) විශාලත්වය ඇති ඉඩම ද වේ.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 3.

02-75

---

## මහජන බැංකුව - නුගේගොඩ ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඇ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.10.20 වැනි දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මහජන බැංකුවේ නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. ජාගොඩ මහත්මිය විසින් සහතික කරන ලද අංක 1656 සහ 1998 අප්‍රේල් 03 වන දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම අශෝක අරුණ ශාන්ත හෙට්ටිආරච්චි විසින් පැහැර හැර ඇති හෙයින්, දැන් එකී අංක 1656 දරන බැඳුම්කරය මත රුපියල් දෙලක්ෂ හත් දහස් විසි හතක (රු.207,027) මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රුපියල් හාරලක්ෂ පනස් දහසක (රු. 450,000) එකී මුදල ද 1998 අප්‍රේල් 06 දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට සියයට විසි පහ (25%) බැගින් තවදුරටත් වූ පොලිය ද විකිණීමේ ගාස්තු ද, එකී මහජන බැංකු පනතේ 29 ඕ වගන්තිය යටතේ අය කර ගත හැකි මුදල් ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු

කිරීමෙන් පසු අයකර ගැනීම සඳහා අංක 1656 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපල සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු අර්වින් පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උකස් කරන ලද දේපල සහ පරිශ්‍ර පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කෝට්ටේ නගර සභා සීමාව ඇතුළත (ගංගොඩවිල) කොට්ඨාස අංක 10 ගංගොඩවිල පිහිටියා වූ ද ඊරියගහඹිවිට *හෙවත්* මීමනගේඹිවිට යයි කියනු ලබන හා හඳුන්වනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. අනිල් පීරිස් විසින් සාදන ලද අංක 1227 හා 1972 පෙබරවාරි මස 02 දින දරන පිඹුරේ ලොට් අංක 11 ලෙස ලකුණු කර ඇත්තා වූ ඊසාන දෙසට : එකී අංක 1227 දරන පිඹුරේ ලොට් අංක 12 ද, ගිණිකොණ දෙසට : ලොට් අංක 13 (පාර) සහ එකී අංක 1227 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 16 ද, නිරිත දෙසට : ලංකාණ්ඩුවේ දුම්රිය සේවයට අයත් දේපළ ද, වයඹ දෙසට : එකී අංක 1227දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 9 හා 10 ද මායිම් වන්නා වූ ද එකී අංක 1227 දරන පිඹුරට අනුව පර්චස් විසි එකක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 21) විශාල වූ ද පැහිරිවත්ත පාරේ වරිපනම් අංක 42 හි කොටසක් වූ ද බෙදා වෙන් කරන ලද මුලු ඉඩම් කොටස එහි පස හා එහි පිහිටි ගහකොළ, වැව්ලි හා වෙනත් සියළුදේත් ය. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්1072/99 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත දැක්වෙන ඉඩම් කොටස් උඩින් මාර්ග ප්‍රවේශ අයිතිය ද මීට ඇතුළත් වේ.

ඉහත කී ගංගොඩවිල පිහිටියා වූ ද ඊරියගහඹිවිට *හෙවත්* මීමනගේඹිවිට යයි කියනු ලබන හා හඳුන්වනු ලබන ඉඩමේ එකී අංක 1227 දරන පිඹුරේ (අඩි 10ක් පළල පාර සඳහා වෙන් කිරීම වන) ලොට් අංක 13 ලෙස ලකුණු කරනු ලැබුවා වූ ද, ඊසාන දෙසට : අංක 1227 දරන පිඹුරේ ලොට් අංක 14 ද, ගිණිකොන දෙසට : එකී අංක 1227 දරන පිඹුරේ ලොට් අංක 15 හා 16 ද, නිරිත දෙසට : එකී අංක 1227 දරන පිඹුරේ ලොට් අංක 16 ද, වයඹ දෙසට : එකී අංක 1227 දරන පිඹුරේ ලොට් අංක 11 හා 12 ද එකී අංක 1227 දරන පිඹුරට අනුව පර්චස් තුනක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 03) විශාල වූ ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස.

කොලඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක 1831/62 යටතේ ලියාපදිංචිකර ඇත. ඉහත කී ගංගොඩවිල පිහිටියා වූ ද ඊරියගහඹිවිට *හෙවත්* මීගහඹිවිට යයි කියනු ලබන හා හඳුන්වනු ලබන ඉඩමේ එකී අංක 1227 දරන පිඹුරේ (අඩි 20ක් පළල පාර සඳහා වෙන් කිරීම වන) ලොට් අංක 14 ලෙස ලකුණු කරනු ලැබුවා වූ ද, ඊසානදෙසට : පැහිරිවත්ත පාර ද, ගිනිකොණ දෙසට : එකී අංක 1227 පිඹුරේ ලොට් 15 ද, ගිණිකොනදෙසට : එකී අංක ලොට් අංක 13 හා 15 ද, නිරිතදෙසට : බලයලත් මිනින්රොද්රු ඩී. ඒ. රණසිංහ මයා විසින් සාදන ලද අංක 1175 හා 1962.02.04 දින දරන පිඹුරේ ලොට් අංක A1 දරන එව්ලින් රත්නායකගේ ඊරියගහඹිවිට *හෙවත්* මීමනගේඹිවිට සහ එකී අංක 1227 දරන පිඹුරේ ලොට් අංක 12 ද, මායිම්වන්නාවූ ද එකී අංක 1227 පිඹුරට අනුව පර්චස් එකොළහයි දශම හතයි පහක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 11.75) විශාල වූ ද කොළඹ මෙම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M1025/267 යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කළාප - 11)

මහජන බැංකුව,
කලාප කාර්යාලය,
(බටහිර කලාප - 11)
අංක 177, හයිලෙවල් පාර, නුගේගොඩ.

01-102

### මහජන බැංකුව-කොග්ගල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2002.11.21 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගාල්ල, ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. ඩී. එම්. පීරිස් විසින් සහතික කරන ලද 2000.05.03 දිනැති අංක 2967 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් ගාර්දියේ වැලිගමගේ අමිත් පියල් ද සිල්වා සහ බොරාල ලියනගේ නන්දාවතී *නොහොත්* නන්දාවතී බොරාල ලියනගේ යන අය විසින් පැහැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් දහ ලක්ෂයක (රු. 10,00,000) මුදලක් දැනට මහජන බැංකුවට ගෙවීමට ඉතිරිව ඇති බැවින් ද, 2001.03.09 දින සිට රුපියල් දශ ලක්ෂයක (රු. 10,00,000) මුදලක් සඳහා වර්ෂයකට සියයට විසි හයයි දශම පහක් (26.5%) බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය සහ වෙන්දේසි ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දස ලක්ෂයක (රු. 10,00,000) මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. ජී. ආනන්ද විසින් එකී අංක 2967 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර අති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුති යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29ඩී වගන්තිය මගින් තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පෙ පත්තුවේ, කතලුව පිහිටි කැටකාලගහවත්ත නැමැති ඉඩමට බලයලත් මානක ඩබ්. ඒ. ගාවින් ද සිල්වා විසින් 1970.03.01 දින මැන සකස් කළ අංක 1295 දරන පිඹුර පරිදි මායිම්, උතුරට : මහ වත්ත ද, නැගෙනහිරට : ගෙදර වත්ත ද, දකුණට : කතලුව තිත්තගල්ල මහා මාර්ගය ද, බස්නාහිරට : දවතියගහවත්ත යන සීමා තුළ පිහිටි රූඩ් දෙකයි, පර්චස් විසිහයයි දශම පහ (අ. 0, රූ. 2, පර්. 26.5) ක් විශාල බිම් කැබැල්ල සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි, ගහකොළ යනාදී සියළු දේද වේ. මෙම ඉඩම් කැබැල්ල ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඩී 566/56 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22, පහළ ඩික්සන් පාර,
ගාල්ල.

02-99

### මහජන බැංකුව-නාරම්මල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.01.19 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් අනුපමා මුහන්දිරම් මිය විසින් සහතික කරන ලද 2000.06.30 දිනැති අංක 852 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම මුත්තිපුරගේ සංජීව උදය කුමාර සහ මුත්තිපුරගේ සෝමසිරි යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ අනූදාස් හාරසිය පනස්දෙකයි ශත හතලිස් අටක (රු. 3,90,452.48) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2005.09.30 වැනි දින සිට වර්ෂයකට සියයට විසි හයයි දශම පහ (26.5%) බැගින් රුපියල් තුන්ලක්ෂ අනූදාස් හාරසිය පනස්දෙකයි ශත හතලිස් අටක (රු. 3,90,452.48) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ අංක 29එල් (29L) වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් තුන්ලක්ෂ අනූදාස් හාරසිය පනස්දෙකයි ශත හතලිස් අටක (රු. 3,90,452.48) මුදල අයකර ගැනීම සඳහා කුරුණෑගල බලයලත් වෙන්දේසිකාර ඩබ්. එම්. අයි. ගල්ලෑල්ල මහතා විසින් එකී අංක 852 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපළ පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පල හත්පත්තුවේ, යටිකහ දකුණු කෝරළේ, බිරිගොඩ ගමෙහි පිහිටි 'ගණේගමුව වත්ත' නමැති ඉඩමට සර්වේ ජනරාල් විසින් පිළියෙල කරන ලද අවසාන ගම් පිඹුරු අංක 964හි කැබලි අංක 62 දරන කොටස සඳහා බලයලත් මිනින්දෝරු ජී. ඒ. එන්. ගුණසිරි මහතා විසින් මැන සාදන ලද අංක 934 හා 1999.10.15 දිනැති පිඹුරේ සඳහන් ඉඩමට මායිම්, උතුරට : කුලියාපිටිය සිට කුරුණෑගල දක්වා වූ මහා මාර්ගය ද, නැගෙනහිරට : අ. ග. පි. 964හි කැබලි අංක 63 ද, දකුණට : අ. ග. පි. 964හි කැබලි අංක 74 ද, බස්නාහිරට : අ. ග. පි. 964හි කැබලි අංක 27ඒ ද යන මෙකී මායිම් තුළ වූ රූඩ් එකයි, පර්චස් තුනක් (අ. 0, රූ. 01, පර්. 03) විශාල ඉඩම සහ ඒ තුළ වූ ගසකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සැම සියලු දේද සමඟ වේ. (ජේ. 46/95-කුලියාපිටිය).

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කලාපීය සහකාර සාමාන්‍යාධිකාරී,
කුරුණෑගල/මාතලේ.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 03, වත්හිම පාර,
කුරුණෑගල.

02-98

### මහජන බැංකුව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ යෝජනාව

වර්ෂ 1986 අංක 12 දරන පනතින් සංශෝධිත වර්ෂ 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2001.08.29 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

අනුරාධපුර එස්. එම්. දීපදු කුමාරි ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් මහජන බැංකුව නමින් ලියා සහතික කරන ලද 1999ක් වූ අප්‍රේල් මස 29 වැනි දින අංක 80 දරන උකස්කරය ප්‍රකාර අයවිය යුතු ගෙවීම් දිවුලන්කඩවල, විහාරගම, අංක 674 දරන ස්ථානයේ පදිංචි මීපේ ආචාරිගේ ධර්මසේන යන අයවලුන් විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් එක්ලක්ෂ විසිහය දහසක (රු. 1,26,000) ක මුදලක් දැනට මහජන බැංකුව වෙත අයවීමට ඇති බැවින් ද, එකී රුපියල් එක්ලක්ෂ විසිහය දහසක (රු. 1,26,000) මුදල ද, රුපියල් එක්ලක්ෂ විසිහය දහසක (රු. 1,26,000) මුදල මත 1999.06.29 දින සිට වෙන්දේසි දිනය දක්වා අවුරුද්දට සියයට විසිහතර (24%) වන තවදුරටත් පොළිය හා වෙන්දේසි ගාස්තුව සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව රුපියල් එක්ලක්ෂ විසිහය දහසක (රු. 1,26,000) මුදල අයකර ගැනීම සඳහා මහනුවර ෂොක්මන් සහ සමරවික්‍රම බලයලත් වෙන්දේසිකාර මහතා විසින් ඉහත කී අංක 80 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කොට ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත වර්ෂ 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපළ පිළිබඳ විස්තරය

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සිංහල පත්තුව්, 68ඒ දිවුලන්කඩවල ග්‍රාම සේවා නිළධාරී කොට්ඨාසයේ, විහාරගම නමැති ගමේ පිහිටා ඇති සර්වේ ජනරාල් විසින් සාදනු ලැබ ඔහු භාරයේ ඇති අංක අ. ජ. පි. පො. 124 දරන පිඹුරෙහි අංක 343 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපනය කර ඇති දිවුලන්කඩවල කැලේ නමැති රජයේ ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට : 325 ද, නැගෙනහිරට : 324, 344 ද, දකුණට : 342 ද, බස්නාහිරට : 283 යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දෙකයි, රූඩ් බින්දුවයි පර්චස් දහඅටක් (අ. 02, රූ. 00, පර්. 18) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි නිවාස ගහකොළ, පළතුරු ආදී සැම සියළු දේත් වෙයි.

මෙය පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක 4/3/27 යටතේ ලියාපදිංචි ව ඇත.

දේපළ වල අවම ලංසුව රුපියල් තුන්ලක්ෂ පනස් දහසක් (රු. 3,50,000) පමණි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 325, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංකීර්ණය,
නව නගරය, පොළොන්නරුව,
දුරකතන : 027-23900, 027-23522, 027-24402
විද්‍යුත් තැපැල : pol@tho.people's bank.lk

02-101

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

සංශෝධිත ගාස්තු

1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළකරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වේලාවන් පෙරවරු 9.00 සිට පස්වරු 4.45 දක්වා වේ.

4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.30 සිට පස්වරු 3.30 දක්වා බව සැලකිය යුතුයි.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතුය.

6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත ඩිපිටපතඩ් කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි :-

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | 51 | 0 |
| වැඩිවන සෑම අඟලකටම හෝ ඉන් කොටසකටම | 51 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | 1,008 | 0 |

(අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)

11. සෑම සිකුරාදා දිනයකම ඩිශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ගැසට් පත්‍රයඞ් පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව* :-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික)

| | මෙරට රු. | ශ. | පිටරට රු. | ශ. |
|---|---|---|---|---|
| I වන කොටස සම්පූර්ණයෙන් (I, II, III ඡේද තුනම ඇතුළත්) | 1,612 | 0 | 2,098 | 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 | 0 | 745 | 0 |
| I වන ඡේදය | 520 | 0 | 1,007 | 0 |
| II වන ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 | 0 | 1,009 | 0 |
| III වන ඡේදය | 468 | 0 | 907 | 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 | 0 | 4,422 | 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

*තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | | මිළ රු. | ශ. | තැපැල් ගාස්තුව (මෙරට) රු. | ශ. |
|---|---|---|---|---|---|
| (අ) | I වන කොටස | 31 | 0 | 5 | 0 |
| | II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 11 | 0 | 5 | 0 |
| (ආ) | I වන ඡේදය | 10 | 0 | 5 | 0 |
| | II වන ඡේදය | 12 | 0 | 5 | 0 |
| | III වන ඡේදය | 9 | 0 | 5 | 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර කොළඹ 01, ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සැහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේම පහසුවටද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ 01, ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

*සැලකිය යුතුයි.-* මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළකිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2007** | | | |
| පෙබරවාරි | 2007.02.02 | සිකුරාදා | 2007.01.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.02.09 | සිකුරාදා | 2007.01.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.02.15 | බ්‍රහස්පතින්දා | 2007.02.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.02.23 | සිකුරාදා | 2007.02.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| මාර්තු | 2007.03.02 | සිකුරාදා | 2007.02.15 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2007.03.09 | සිකුරාදා | 2007.02.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.03.16 | සිකුරාදා | 2007.03.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.03.23 | සිකුරාදා | 2007.03.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.03.30 | සිකුරාදා | 2007.03.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| අප්‍රේල් | 2007.04.05 | බ්‍රහස්පතින්දා | 2006.03.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.04.12 | බ්‍රහස්පතින්දා | 2006.03.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.04.20 | සිකුරාදා | 2007.04.05 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2007.04.27 | සිකුරාදා | 2007.04.12 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.